මගේ අංකය : ඩී16/ස්ථාන මාරු/2018
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2019.01.29

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

**<u>වර්ෂ අවසාන ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණ - 2018</u>**

මගේ අංක: ඩී16/ස්ථානමාරු/2018 සහ 2018.12.18 දිනැති ස්ථානමාරු මණ්ඩල තීරණ වලට අනුව ඉදිරිපත් කර ඇති සමාලෝචන ඉල්ලීම් සලකා බලන ලද අතර, එම ස්ථානමාරු සමාලෝචන කමිටු තීරණ මේ සමඟ අමුණා ඇත.

02. සමාලෝචන කමිටු තීරණ 2019.02.15 දින සිට ක්‍රියාත්මක වියයුතු අතර, ස්ථාන මාරු ලැබී ඇති සියලුම නිලධාරින්ට ඒ බව දැනුම් දීමට කටයුතු කරන්න.

03. අභියාචනා ඉල්ලීම් ඉදිරිපත් කළ ද, මෙම ලේඛනයේ නම් සඳහන් කර නොමැති නිලධාරින්ගේ ස්ථානමාරු සමාලෝචන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වී ඇති අතර, ඔවුන් හට ස්ථානමාරු මණ්ඩලය විසින් ස්ථානමාරු ලබා දී ඇති නම්, එම ස්ථානමාරු 2019.02.15 දින සිට ක්‍රියාත්මක කල යුතුය.

04. සමාලෝචන කමිටු තීරණ අනුව ප්‍රමාද කර ඇති ස්ථානමාරුවීම්, දක්වා ඇති කාල සීමාවෙන් පසු අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතු අතර මීට පෙර වසර වල ප්‍රමාද කර ඇති ස්ථානමාරු 2019.02.15 දින සිට අනිවාර්යෙන් ක්‍රියාත්මක කලයුතු බව ද දන්වමි.

06. විශ්‍රාම යාමට යටත්ව ස්ථාන මාරු අවලංගු කරන ලද හෝ ප්‍රමාද කරන ලද නිලධාරීන්ගේ ස්ථානමාරු, ඔවුන් එදිනට විශ්‍රාම නොයන්නේ නම් අනිවාර්යෙන්ම ක්‍රියාත්මක කළයුතු බව දන්වමි. එම නිලධාරීන් මෙතෙක් විශ්‍රාම අයදුම්පත් ඉදිරිපත් කර නොමැති නම්, කඩිනමින් එම විශ්‍රාම අයදුම්පත් මූලස්ථානය වෙත යොමු කළ යුතුය.

සමාලෝචන කමිටුව:-

| | |
|---|---|
| 01.එච්.එම්.එන්.සී.ධනසිංහ (සභාපති) | - බන්ධනාගාර කොමසාරිස් ජනරාල් |
| 02.කේ.ඩී.බී.ජයසිංහ (සාමාජික) | - අතිරේක ලේකම් (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ),අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය |
| 03.එස්.කේ.යූ.ශාන්ත ප්‍රනාන්දු මහතා (සාමාජික) | - බන්ධනාගාර කොමසාරිස් (කර්මාන්ත) |
| 04. කේ.කේ.එස්.යූ.රංජන් මහතා (සාමාජික) | - බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) |
| 05. සී.එස්.අමරවික්‍රම (සාමාජික) | - පරිපාලන නිලධාරි I |

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.